# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2152/3 - 2019 දෙසැම්බර් මස 02 වැනි සඳුදා - 2019.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* ඩීඑච්ඕ/එල්එන්/ඒසීකිව්වීඑන්/ඒ3/2/11.
*ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ*
*යොමු අංකය:* 4-3/8/2016/පීඩී/451.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අටුළුගම් කෝරළයේ, බටහිර සුළු කොට්ඨාසයේ, අංක 116 සී කනන්ගම ග්‍රාම නිළධාරී වසමේ අටුළුගම ගමේ පිහිටි අංක මු.පි.කැ. 3697 දරන 2019.07.29 දිනැති මූලික පිඹුරේ අංක 1 දරන පහත විස්තර කරන ඉඩම් කැබැල්ල:

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: දේවාලකන්ද වතුයාය - අක්කර මලය කොටස; ඉඩම් පරිහරණය: වත්ත, අවුරුදු 15 -20ක් පමණ වයසැති රබර් වගාවක් ඇත, වර්තමාන අයිතිය; හිමිකම් කියන අය: කැලණිවැලි වැවිලි සමාගම, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10; ප්‍රමාණය: හෙක්. 0.8094.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2020 ජනවාරි මස 16 වැනි දින පෙ.ව. 10.00ට දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2020 ජනවාරි මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

යූ. පී. චන්දන අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිඕවිට.

2019 නොවැම්බර් මස 22 දින,
දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

12 - 524



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*